ආචාර්ය ජයන්ත ධනපාල විසින් සර්වෝදයේදී පවත්වන ලද දේශනය

සර්වෝදය නායක ආචාර්ය ඒ. ටී. ආරියරත්න මැතිතුමනි. සර්වෝදය සංවිධානයේ සියලු සාමාජික සාමාජිකාවනි. ආරාධිත අමුත්තනි, නෝනාවරුනි මහත්වරුනි.

සර්වෝදය සංවිධානය මඟින් මේ අවස්ථාවේදී මා හට පිරිනමන්නට යෙදුණු සම්මානය සම්බන්ධයෙන් මා පළමු කොට මගේ හද පිරි කෘතඥතාව පල කර සිටිමි. ඒ එක්කම පසුගිය වසරේ පැවති වාර්ෂික සම්මාන ප්‍රදානොත්සවයට සහභාගී වෙන්නට මට නොහැකි වීම ගැන, කණගාටුව ප්‍රකාශ කරන්නටත් මෙය අවස්ථාවක් කර ගනිමි. ඒ අවස්ථාව මට මඟඇරුනේ එකල මා රටින් බැහැරව සිටි නිසා බව කිව යුතුයි. කොහොම වුණත් මා වෙනුවෙන් මෙවැනි විශේෂ උත්සවයක් සංවිධානය කිරීම ගැන, නැවත වරක් සර්වෝදය සංවිධානයට, මගේ කෘතඥතාව පිරිනමන්නට කැමතියි.

සර්වෝදය සංවිධානයේ ආරම්භක සභාපතිවරයා වන ඒ. ටී. ආරියරත්න මැතිතුමා මා දැන හඳුනා ගෙන, දැන් වසර ගණනනාවක් වෙනව. මෙතුමා අපේ රටේ විශිෂ්ට පුරවැසියෙක්. මා ඇමෙරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති වරයා හැටියට කටයුතු කළ අවදියේ දිනෙක, එතුමාව ධවල මන්දිරයට රැගෙන යන්නට මට අවස්ථාව ලැබුණ. එය මා අදත් සිහිපත් කරන්නේ ආඩම්බරයට කාරණයක් හැටියටයි.

සර්වෝදය සංවර්ධනය වෙනුවෙන් කැප වුණු සංවිධානයක්. එහි හැඩගැස්ම බෞද්ධ දර්ශනයට අනුව බව පැහැදිලියි. එමෙන්ම මෙය රටේ සම්ප්‍රදායික සංස්කෘතියෙන් පෝෂණය වන සංවිධානයක්. ඇත්තටම සර්වෝදය සංවිධානය ශ්‍රී ලාංකික ජන සමාජයට ආඩම්බරයක්. එමෙන්ම එය ධෛර්යයක්. අපේ රටේ බොහෝ දේශපාලනඥයන්ගෙන් ඉටුවෙන සේවයට වඩා, සිවිල් සමාජයටත්

රටටත් සර්වෝදයෙන් සිදුවන සේවය ඉතා විශාලයි. ඒ බව අප නිහතමානීව පිළිගත යුතුයි.

ඔබ දන්නා පරිදි මගේ පෞද්ගලික අත්දැකීම වන්නේ රාජ්‍යතාන්ත්‍රික සේවය. අන්තර්ජාතික සබඳතා සමඟ මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ කටයුතු කිරීම. මගේ සේවා කාලයෙන් වැඩි පංගුවක් වෙන්වුණේ සාමය ගොඩනැගීමට හා නිරායුදකරණයට. මම හැම විටම උත්සහ කළ විදියට මම දන්නා විෂය ගැන මට ඇති දැනුම ගැන මෙතනදීත් මා කතාකරන්නට කැමතියි.  නොදන්නා විෂයන් ගැන කතාකරන්න ගියොත් අමාරුවේ වැටෙන්න පුලුවන් කියලා අපි කවුරුත් දන්න දෙයක් .

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලේකම්ව සිටි කොෆී අනන් මහතා වරක් මෙවැනි ප්‍රකාශයක් කළා මට මතකයි.
''මිනිසුන්ට කිසිවිටෙක සංවර්ධනය නැතිව ආරක්ෂාව අත්විඳින්නට නොහැකියි. එසේම ආරක්ෂාව නොමැතිව සංවර්ධනය අත්විඳින්ටත් නොහැකියි. එපමණක් නොව මානව හිමිකම් නැති විට සංවර්ධනයත් ආරක්ෂාවත් යන මේ දෙඅංශයම අත්විඳින්නට නොහැකියි.''
එයින් තේරුම් යන්නේ කුමක්ද? ආරක්ෂාව සඳහා හා හමුදාව සඳහා බිලියන ගණනින් වියදම් කළත් සංවර්ධනය සඳහා මෙන්ම මිනිසත්කම ආරක්ෂා කිරීමට කිසිවක් නොකළොත් ජනසමාජයට යහපතක් අත්නොවෙන බව. ඒකයි එයින් කියවෙන්නෙ.

ජාතික ආරක්ෂාව හා මානුෂික ආරක්ෂාව අතර ඉතා පැහැදිළි වෙනසක් තියෙන බව මා මෙහිදී අවධාරණය කරන්නට කැමතියි. ජාතික ආරක්ෂාව යනුවෙන් අදහස් කරන්නෙ ජාතියේ පරමාධිපත්‍ය රැකීම, රජය සහ දේශ සීමාවන් ආරක්ෂා කිරීම, යන දේවල්. මානුෂික ආරක්ෂාව යනුවෙන් අදහස් කරන්නෙ පුද්ගලයින්ගේ ආරක්ෂාව, මානව හිමිකම් ආරක්ෂා කිරීම යන දේවල්. ජන සමාජයකට මෙම මානුෂික ආරක්ෂාව ඉතාම වැදගත් වන බව අප තරයේ සිහි තබා ගත

යුතුයි. සමහර රටවල් තමන්ගෙ ජාතික ආරක්‍ෂාව ගැන පමණයි සැලකිලිමත් වෙන්නෙ. මානුෂික ආරක්‍ෂාව ගැන කිසිදු තැකීමක් නැහැ. ඇතැම් ප්‍රජාතන්ත්‍රවාදී රටවල් පවා ඒ විදියටයි වැඩ කරන්නෙ. එහෙම වුණාම ඒ රටවල පුරවැසියන්ගේ අයිතිවාසිකම් පැහැර හැරීමක් සිද්ධ වෙනව. රටක ජාතික ආරක්‍ෂාව තිබූ පමණින් ඒ රටේ මානුෂික ආරක්‍ෂාවත් තිබෙනවාය කියා පිළිගන්නට අමාරුයි.

2009 වර්ෂයට යුද්ධ ආයුද සඳහා මුළු ලෝකය වැය කළ මුදල ඇමෙරිකානු ඩොලර් බිලියන 1531 ක්. එය ශ්‍රී ලංකා මුදලින් රුපියල් බිලියන 172742 ක්. එතරම් ධනයක් ඊට යොදවන අතරවාරයේ, ලොව පුරා දරුණු අවි ගැටුම් 17 ක් සිද්ධ වුණා. ලෝකයේ මුළු ජනගහනය බිලියන 6 යි. එයින් එක් බිලියනයක් දිලුඳුභාවයෙන් හා බඩගින්නෙන් පෙළෙනව. ඔක්ස්ෂර්ඩ් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාඥයෙක් පොල් කොලියෙර් මහාචාර්ය තුමා මේ කොටස හඳුන්වා ගෙන ඇත්තේ " The bottom billion " කියාය . මන්දපෝෂණය නිසා සෑම තප්පර 6 ට වරක්ම කොහේ හෝ තැනක ළමයෙක් මිය යනව.
මේ තත්ත්වය ගැන සලකල එසේ දිලුඳුභාවයෙන් හා බඩගින්නෙන් පෙළෙන ප්‍රමාණය හරි අඩකින් අඩු කර ගැනීමට ලෝකයේ රටවල් දැන් එකඟ වෙලා ඉන්නව. එසේම ලෝකයේ සියලුම දරුවන්ට ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීමටත් ලෝකය දැන් එකඟ වෙලා ඉන්නව. එවැනි කරුණු 8 ක් 2015 වන විට සම්පූර්ණ කර ගන්නට දැන් මුළු ලෝකයම එකඟ වෙලා ඉන්නව. සහස්‍ර සංවර්ධන ඉලක්ක එකයි. ඉංග්‍රිසියෙන් මෙයට කියන්නේ " Millennium Development Goals" කියාය. මේ ව්‍යාපෘතියට කොපමණ මුදලක් වැය වනු ඇතැයි ඔබ හිතනවද? ඇත්තට ම ඒ සඳහා වැය වෙන්නෙ ඩොලර් බිලියන 40 ත් 60 ත් අතර මුදලක්.

ලොව පුරා ඇති අවි ගැටුම් ගැන කතාකරන විට මේ රටේ තත්ත්වයත් අපට අමතක කරන්න බැහැ. යුද මෙහෙයුමක් දියත් කරල ගරු ජනාධිපති තුමා ත්‍රස්තවාදය පරාජය කළ විට අප කවුරුත් සතුටු

වුණා. ඒ ජයග්‍රහණය ලබා ගත්තෙ ගිය අවුරුද්දෙ. දැන් අවුරුද්දක් ගත වෙලා ඉවරයි. ඒත් රටට තවම ඒ ජයග්‍රහණය තහවුරු කර ගන්නා වැඩ පිළිවෙලක් නැහැ. ඒ සඳහා අවශ්‍ය දේශපාලන විසඳුම තවම ඉදිරිපත් කෙරිල නැහැ. අපේ රටේ ස්ථාවරභාවයට හා සාමයට නැවත කිසිදාක ත්‍රස්තවාදී තර්ජනයක් එල්ල නොවන ආකාරයේ දේශපාලන විසඳුමක් ඉදිරිපත් විය යුතුයි.

මෙතනදී අවතැන්වූවන්ගේ ප්‍රශ්නය හරිම වැදගත්. සර්වෝදය සංවිධානයත් තවත් එවැනි සංවිධානත් මහත් පරිශ්‍රමයකින් යුතුව ඊට මැදිහත් වූ පසුවත් දක්නට ඇත්තේ සතුටු දායක තත්ත්වයක් නොවේ. අවතැන්වූවන් නැවත පදිංචි කරීමේ කටයුතු තවමත් නිසි ලෙස සිදුවී නැහැ. අර්බුදයට තුඩු දුන් දේශපාලන ගැටළු තවමත් විසඳී නැහැ. එවැනි සාධාරණ ඉල්ලුම් පිළිබඳ තවත් සමහරු කිසිදු පිළිසරණක් නැතිව ජීවත් වෙන බව අප දන්නව. මානුෂික ආරක්ෂාව ගැන හෝ මානව හිමිකම් ආරක්ෂා කිරීම ගැන අවංකවත් විනිවිද භාවයෙනුත් කටයුතු කර නැති බවක් තමයි පෙනෙන්නට තියෙන්නෙ. මේ දේවල් ගැන මහජනතාව තුළ සැක සංකා පවතිනව.

මේ මෑතකදී ඉදිරිපත් කළ අය වැයෙන් ආරක්ෂක කටයුතු වෙනුවෙන් රුපියල් බිලියන 200 ට ආසන්න මුදලක් වෙන් කළා. එහෙත් අධ්‍යාපනය සඳහා වෙන්වුණේ රුපියල් බිලියන 47 යි. සෞඛ්‍ය සඳහා වෙන්වුණේ රුපියල් බිලියන 53 ක් තරම් මුදල් ප්‍රමාණයක්. අපගේ ප්‍රමුඛත්වය තවමත් යොමු වී තියෙන්නෙ මානුෂික ආරක්ෂාව නොව ආයුද සන්නද්ධ ආරක්ෂාවකට බව මෙයින් පැහැදිළි වේ, මෙය වෙනස් විය යුතු තත්ත්වයක්.

ත්‍රස්තවාදය පැවති කාලයේ උතුරේ මෙන්ම දකුනේද ආයුද සංස්කෘතියක් ඇති කළා. ඒ සංස්කෘතිය පැතිරී ගියා . මුළු රටම වාගේ කුඩා අවි වලින් පිරී ගියා. ආයුදයක් නැතිව මෙහි කිසිවෙකුට ආරක්ෂාවක් නැති බවට හැඟීමක් පහළ වුණා. දැන් ත්‍රස්තවාදය ඉවරයි.

හැබැයි එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදය පරාජය කළාට පසුවත් ඒ ආයුද සංස්කෘතිය ඉතිරිවෙලා තියෙනව. ආයුද සංස්කෘතිය වෙනුවට සාම සංස්කෘතියක් ඇතිවන බවක් පෙනෙන්ට නැහැ. අද නගරයේ මෙන්ම ඈත පිටිසර ගමේ පවා ගැටුම් හරි සුලබයි. මෙයට ප්‍රධාන හේතුවක් තමයි තුවක්කු.

'මතට තිත' යනුවෙන් නම් කර ඇති, මත්පැන් විරෝධී වැඩ සටහනක් ගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් රටේ ජනතාවගේ සහයෝගයෙන් යුතුව ක්‍රියාත්මක වෙනව. 'අවියට තිත' යනුවෙන් වැඩසටහනක් සර්වෝදයේ මූලිකත්වයෙන් ක්‍රියාවට නැගීම සුදුසු බව මා මෙහිදී යෝජනා කරන්නට කැමතියි.

කුඩා අවි පහසුවෙන් ලබා ගන්නට ඇති හැකියාව වැඩි වෙන තරමට අර්බුද හා ගැටුම් සුලබ වෙනව. මේ ආයුද අඩු මිලකට මිල දී ගන්නට ඇති හැකියාව නිසා ළමයින් අතට පවා ඒවා පහසුවෙන්ම ලැබෙනව. අපි ඒ ගැන එතරම් සැලකිල්ලක් නොදක්වූවාට මොකද, එය හරිම භයානක තත්ත්වයක්. අනෙක මේ කුඩා අවි පහසුවෙන් එහා මෙහා ගෙන යන්නත් හැකියාව තියෙනව. අද ලොව සිදුවන මිනිස් අයිතිවාසිකම් උල්ලංගණය වීම් වලින් සියයට හැටක්ම මේ සුළු අවි යොදාගෙන කෙරෙන අපරාධ හා සම්බන්ධයි. ඇත්ත ඒකයි.

ශ්‍රී ලංකාවේ මේ කුඩා අවි පාලනය කරන්නට හැකි නීති රීති අවශ්‍යයි. දනට ක්‍රියාත්මක ගිනි අවි පනත 1916 බ්‍රිතාන්‍ය පාලන සමයේ සම්මත වූ පනතක්. මේ රටේ භාවිතා කෙරෙන ගිනි අවි වලින් කොපමණ ප්‍රමාණයකට බලපත්‍ර දී තිබෙනවාද? බල පත්‍ර රහිතව ගිනි අවි කොතරම් ප්‍රමාණයක් භාවිතා කරනවාද? ඇත්තටම අප ඒ ගැන හරියටම දන්නෙ නැහැ. එක් රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් කළ සමීක්ෂණයකට අනුව එවැනි ගිනි අවි මිලියන 1.9 ක් ඇති බව හෙළි වී තිබෙනව. පුවත්පත් වාර්ථා වලින් කියවෙන විදියට එල්. ටී. ටී. ඊ. සංවිධානය සතුව පැවති ආයුද වරින්

වර සොයා ගන්නව. මෙම ආයුද හැම එකක්ම රජයේ භාරයට පත්වෙනවා යැයි සිතන්නට පුළුවන්ද? පාතාලයට හුඟක් වෙලාවට ආයුද ලැබෙන්නෙ හමුදාවෙන් පැන යන සෙබළු වෙතින් බව සිතන්නට පුළුවන්. ඇතැම් වෙලාවට ඇතැම් පළාත් වල ගොවියන් මර උගුල් අටවන්නට යොදා ගන්නා ගිනි අවි ද අපරාධ සඳහා යොදා ගන්නා බව පෙනෙන්නට තිබෙනව. මේකයි ඇත්ත තත්ත්වය.

තුවක්කු තිබිය යුතු හමුදාව සතුව පමණයි. පෞද්ගලිකව භාවිතා කරන ගිනි අවි සඳහා බල පත්‍ර නිකුත් කිරීමේදී ඉතා දැඩි පිළිවෙතක් අනුගමනය කළ යුතුයි. ඉතාම සාධාරණ අවස්ථා වලදී පමණක් එම අවසරය ලබා දිය යුතුයි.
පශ්චාත් යුද සමයක කාලය ගෙවන අපි ත්‍රස්තවාදය වැලක්වීමට කටයුතු කරනවා වාගේම ආයුද නැති සමාජයක් බිහිකර ගන්නටත් කටයුතු කළ යුතු වෙනව. ආයුදකරණය කළ ශ්‍රී ලංකා සමාජය නිරායුද කළ යුතු බව මා මෙහිදී අවධාරණය කරන්නට කැමතියි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිරායුදකරණ වැඩපිළිවෙල මා භාරයේ තිබුණු අවදියේදී න්‍යෂ්ඨික අවි වලට විරුද්ධව දැඩි ක්‍රියා මාර්ගයක් අනුගමනය කළා. සංවර්ධනය වන රටවල සංවර්ධන ක්‍රියාවලියට සෘජුවම බාධා කරන කුඩා අවි පැතිරීම වැලක්වීමටත් ව්‍යාපාරයක් දියත් කළා. දැනට ගණන් බලා ඇති පරිදි ලොව පුරා කුඩා අවි මිලියන 875 ක් පමණ තියෙනව. එයින් සියයට 75 ක්ම තියෙන්නෙ සිවිල් සමාජයේ. මෙම අවි වලින් පමණක් වසරකට ජීවිත පන් ලක්‍ෂයක් පමණ බිලි ගන්නව.

2001 වර්ෂයේදී අප විසින් විශේෂ සමුළුවක් පවත්වා අවි ජාවාරම් වැලක්වීමට වැඩ පිළිවෙලක් සකස් කළා. එම වැඩසටහන දැනටත් ක්‍රියාත්මකයි. සෑම අවුරුදු දෙකකට වරක් එහි ප්‍රගතිය සොයා බලන රැස්වීමක් පැවත්වෙනව. දැන් නිව්යෝක් නගරයේ ආයුද වෙළඳාම සම්බන්ධව සම්මුතියක් සඳහා ප්‍රාරම්භක කමිටුවක් ද ක්‍රියාත්මකයි.

එමගින් ලොව පුරා කෙරෙන අවි ගනුදෙනු විධිමත් කෙරෙනව. ඒ විදියට වෙනත් රටවල ඇති අත්දැකීම් අප ප්‍රයෝජනයට ගත යුතුයි. අපේ රටේ පැතිරී ඇති ආයුද සම්බන්ධයෙන් ගත යුතු පියවරයන්ට එම අත්දැකීම් උදව් කර ගන්නට පුළුවන්. අපේ රටේ වැඩිපුර ඇති ආයුද විනාශ කෙරෙනවා දැකීම මාගේ අභිප්‍රාය බව මෙහිදී සඳහන් කළ යුතුයි. එවැනි පියවරක් ගැනීමෙන් රටේ ආයුද සංස්කෘතිය අහෝසි වී ත්‍රස්තවාදයද අවසන් වනවා නිසැකයි. ආයුද එකිනෙකා අතට පත් වීම වැලක්වීමට ගත යුතු පියවරයන් තිබෙනව. මෙහිදී ඒ ක්‍රම අපට භාවිතා කරන්නට පුළුවන්.

නිදැල්ලේ තුවක්කු භාවිතයට ඉඩ හැරීම රටේ ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල තර්ජනයක්. ආයුද අතේ ඇති කල්ලි වැඩිවන විට නීත්‍යානුකූල රජය අසීරුවට පත්වෙනව. එවිට නීත්‍යානුකූල රජය ආයුද අතේ ඇති අයගේ හා පාතාල කල්ලි වල අණසකට යටත් වීමේ අවදානමක් ඇති වෙන්න පුළුවන්. පාතාල ලෝකය මර්දනය කරන්නට ඇති හොඳම උපාය මාර්ගය මිනීමරුවන් අත ඇති ආයුද ආණ්ඩුව විසින් අත්පත් කර ගැනීමයි. එහෙම නැතිව මිනීමරුවන් හා ගැටුමකට යාම සාර්ථක පියවරක් නොවේ. අප තෝරා පත් කරගත් රජයට රට පාලනය කරන්නට ඉඩ දිය යුතුයි. එය පාතාලයේ මිනීමරු කල්ලි වල අණසකට යටත් නොවිය යුතුයි.

ආයුද තිබිය යුතු වන්නේ ආරක්ෂක හමුදාවන් හා අවසර නිසි පරිදි ලබා ගත් පාර්ශවකරුවන් ළඟ පමණමයි. වෙනත් අය අත ඇති ගිනි අවි රජය අත්පත් කර ගත යුතුයි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ප්‍රබලම තර්ජනය එල්ල කළ එල්. ටී. ටී. ඊ. සංවිධානය යුදමය ලෙස පරාජය කර ඇති මේ වෙලාවේ, වහාම කළ යුතු දේ වන්නේ එයයි. ත්‍රස්තවාදය පරදා ලැබූ ජය, සමාජයේ පැතිරී ඇති ආයුද ඉවත්කරීමෙන් තහවුරු කරගත යුතුයි.

මේ විදියට සමාජයේ ආයුද පැතිරීම නිසා අද මිනිස් ජීවිතයේ වටිනාකම අන්තිමටම අඩුවෙලා. ජීවිතය තුට්ටුවකට ගණන් නොගන්නා තැනකට වැටිල. කොන්ත්‍රාත් ක්‍රමයට එක් එක්කෙනා මරණව. ලැබෙන ආරංචිවල හැටියට තාක්‍ෂණයෙන් ඉහල, වටිනා තුවක්කු වුණත් ඉතාම අඩු මිලට ගන්නට අවස්ථාව තියෙනව. ඒකයි ඇත්ත තත්ත්වය. මේ තුවක්කු භාවිතය නිසා අපේ ආචාර ධර්ම නැත්තටම නැතිවෙන තැනට ඇවිල්ල. මෙය මහ පිලීලයක්. දකුණු ආසියාවේ ත්‍රස්තවාදය පැතිර පවත්නා බව අප අමතක නොකළ යුතුයි. ඒ නිසා මේ පිලීලය සීඝ්‍රයෙන් පැතිරෙනව. අපේ රටේ ත්‍රස්තවාදය නැතිකළ බව ඇත්ත. එහෙත් මිනිස් ජීවිත ආරක්‍ෂා කරගත හැකි මට්ටමේ ශක්තිමත් ප්‍රාකාර අප ගොඩනගාගෙන නැහැ. අපට ඇතැයි සිතන ප්‍රාකාරවල ඕනතරම් සිදුරු තිබෙනව. හොර රහසේ නැව් මගින් හෝ බෝට්ටු මගින් මේ රටට ආයුද ගෙන එන අයට ඒ සිදුරු හොඳටම ප්‍රමාණවත්.

මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට වාගේම ශ්‍රී ලංකාව, අනෙක් රටවලට හොර රහසේ ආයුද බෙදන මධ්‍යස්ථානයක් ද වී තිබෙන බව අප අමතක නොකළ යුතුයි. එහෙම රටට ගෙන එන ආයුද වලින් ප්‍රමාණයක් මේ රටේ භාවිතයටත් තියාගන්න පුළුවන්. ආයුද මෙහෙට ගෙනත් වෙනත් රටවලට යවනවාය කියා අපට අහක බලා ගෙන වරදින් නිදහස් වෙන්න බැහැ. තුවක්කු සම්බන්ධයෙන් කලාපීය මට්ටමෙන් අනුගමනය කරන පිළිගත් ක්‍රියාමාර්ගවල හවුල් කරුවන් බවට අපත් පත් විය යුතුයි.

සාමය ස්ථාපිත කරන්නට අපට අවංක වුවමනාවක් ඇත්නම් ගැටුම්කාරී සංස්කෘතිය අවසන් කළ යුතුයි. අප උදාකර ගත යුතු වන්නේ එවැනි සාමයක්. හමුදාවන්හි නීත්‍යානුකූල අයිතියට හැර ඉන් පිටත ආයුද නොතිබිය යුතුයි.
ජාතික ආරක්ෂාව ගැන සැලකිලිමත් වන තරමට ම මානුෂික ආරක්ෂාව ගැනත් අප සැලකිලිමත් විය යුතුයි. අවසාන වශයෙන් "

අවියට තිත " නමින් වැඩසටහනක් ආරම්භ කළයුතු බව ඔබ සියලු දෙනාට මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරමි. ස්තූතියි .